# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2037/13 - 2017 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමිය විසින් කරනු ලබන නිවේදනයයි

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර අමරා පියසීලි රත්නායක වන මා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 (ඊ) ව්‍යවස්ථාවේ (5) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පරිදි වයඹ පළාත් සභාවේ නව අමාත්‍ය මණ්ඩලය පත් කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 165 වැනි ව්‍යවස්ථාව සහ "157 අ 7" වැනි ව්‍යවස්ථාවට අනුකූලව, ගරු දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක මැතිතුමා හා ගරු පියසිරි රාමනායක මැතිතුමා වර්ෂ 2017ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින කොළඹ දී ද, ගරු ආර්. පී. ඩී. ගුණදස දෙහිගම මැතිතුමා හා ගරු ඩබ්ලිව්. ජේ. සුමල් තිසේරා මැතිතුමා වර්ෂ 2017 ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දින කුරුණෑගල දී ද පහත සඳහන් ධුරයන් සඳහා මා ඉදිරිපිට ප්‍රතිඥා/දිවුරුම් දෙන ලද බව මෙයින් නිවේදනය කරමි.

| | |
|---|---|
| ගරු දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක මැතිතුමා | වයඹ පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන්. |
| ගරු පියසිරි රාමනායක මැතිතුමා | වයඹ පළාත් සමූපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යවරයා වශයෙන්. |
| ගරු ආර්. පී. ඩී. ගුණදස දෙහිගම මැතිතුමා | වයඹ පළාත් මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යවරයා වශයෙන්. |
| ගරු ඩබ්ලිව්. ජේ. සුමල් තිසේරා මැතිතුමා | වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යවරයා වශයෙන්. |

අමරා පියසීලි රත්නායක,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

10 - 85


1A - PG 3694 — 17 (2017/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*